**ලෝක ළමා දිනය සැමරීමට හමුදා හටපිරිස් එක්වේ**

ලෝක ළමා දිනය නිමිත්තෙන් පසුගිය සතිය පුර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් විවිධ වැඩසටහන් ගණනාවක් පවත්වන ලද බැව් යුද්ධ හමුදා නිල වෙබ් අඩවිය පවසයි. පසුගිය සඳුදා (ඔක් 01) දින කිලිනොච්චි ප්‍රදේශය තුල වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී දිළිඳු පවුල්වල සිටින පාසල් ළමුන් හට ආරම්භක තැන්පතුවක් සහිතව බැංකු ගිණුම් පොත් බෙදාදෙනු ලැබීය. මෙම වැඩසටහන සඳහා මහජන බැංකුව වෙතින් අනුග්‍රහය ලබාදෙනු ලැබීය. මීට අමතරව, කනගපුරම් පිහිටි මාහාදේව ළමා නිවාසයේ ළමුන් 185 දෙනෙකු සහ එහි කාර්යමණ්ඩලයට දිවා ආහාරවේලක් ලබාදෙනු ලැබූ අතර සංගීතයෙන් සහ නර්තනයෙන් එම නේවාසික ළමුන් විනෝදාස්වාදයට පත්කරන ලදී.

තවද විශ්වමඩු, තොට්ටිඅඩි ප්‍රජා ශාලාවේ දී අඩු ආදායම්ලාභී පවුල්වල සිටින වයස අවු : 05 ට අඩු ළමුන් සඳහා සිසු උදාන බැංකු ගිණුම් පොත් බෙදාදෙන ලදී. එමෙන්ම, කන්දාවලි රංගන් පෙර පාසලේ ළමුන් සඳහා කෙටි ආහාරවේලක් සහ ත්‍යාග පාර්සල් බෙදාදෙන ලද අතර විශ්වමඩු මන්තිි පෙර පාසලේ ළමුන් සඳහා උදෑසන ආහාරය සහ රසකැවිලි බෙදාදෙන ලදී.

තවද එදිනම පන්නණ්කණ්ඩි - පරන්තන්, මලවෙහල් පෙර පාසලේ ළමුන් 14 දෙනෙකු සඳහා මුලික තැන්පතු සහිත බැංකු ගිණුම් පොත් සහ ලිපිද්‍රව්‍ය බෙදාදෙනු ලැබීය. එමෙන්ම යුද්ධ හමුදා හටපිරිස් විසින් මාන්කුලම් ළමා නිවාසයේ ළමුන් සඳහා ද දිවා ආහාර වේලක් ලබාදෙනු ලැබීය.

තවද යාපනය මිරුසුවිල්, කරම්පගම් රජයේ දමිළ මිශ්‍ර පාසලේ තෝරාගත් සිසුන් 49 ක් සඳහා පාසල් උපකරණ, ලිපි ද්‍රව්‍ය සහ පාසල් පාවහන් තොගයක් පසුගිය සඳුදා (ඔක් 01) දින බෙදාදෙන ලදි. මෙම වැඩසටහන සඳහා 'Shatter of the Silence' පුණ්‍ය සංවිධානය පූර්ණ අනුග්‍රහය දක්වන ලදී. මෙම වැඩසටහනට සහභාගී වූ සිසුන් සඳහා දිවා ආහාරය ද පිරිනැමුහ.